ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2008/2009
ජාත්‍යන්තර නීතිය - LWU 3315/4335/4312
කාලය විනාඩි 40 යි.

---

දිනය - 2008 දෙසැම්බර් 11 වන දින    වේලාව - පෙ.ව.11.30- ප.ව.12.10 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. විශේෂ භෞමික කලාප සඳහා අදාළවන නෛතික තත්වයන් රාජ්‍යයන් අත්පත්කර ගැනීමේ සාමාන්‍ය ක්‍රමයන්ට අදාළ වන්නා වූ රීතිවලට ව්‍යතිරේඛ වේ. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් තෝරා ගන්න. ඒවා සඳහා අදාළ වන විශේෂ රීති සාමාන්‍ය රීතිවලින් වෙනස් වන්නේ කෙසේදැයි සලකා බලන්න.

- ධ්‍රැවීය කලාප
- ආකාශය සහ අභ්‍යවකාශය
- ගංගා සහ ඇළදොළ

ජාත්‍යන්තර සම්මුති, දේශීය හා විදේශීය ආයතනයන්හි නඩු තීරණ තිබේ නම් ඒවා මගින් ද ලබාගත හැකි සාක්ෂි ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

02. "විදේශීය ස්වාධිපත්‍යයාගේ අභිමානය වඩාත් ආරක්ෂා වන්නේ නීතියේ ආධිපත්‍යයට ඉහළින් සිටීමට වඩා ඊට අනුගත වීමෙන් සහ ඔහුගේ ස්වාධීනත්වය වඩාත් තහවුරු වන්නේ අපක්ෂපාති අධිකරණයන්හි තීරණ පිළිගැනීමෙන් මිස අත්තනෝමතික ලෙස ඔවුන්ගේ අධිකරණ බලය ප්‍රතික්ෂේප කිරීමෙන් නොවේ. සෑම ශිෂ්ට රටකට ම තමාගේ අධිකරණයන්හි ම ස්වාධිපත්‍යයාට එරෙහිව නඩු පැවරීම පිළිබඳ වූ ප්‍රගතිශීලී නැඹුරුවක් පවතී. අපට ප්‍රදානය නොකරන්නා වූ විනිර්මුක්තියක් විදේශීය රාජ්‍යයන්ගේ දෙපාර්තමේන්තු හා නියෝජ්‍ය ආයතන වෙත ප්‍රදානය කිරීමේ කිසිදු හේතුවක් නොමැත."

ඩෙනිං සාමිවරයා, Rahimtoola v Nizam of Hydrabad and another [1958]A.C 379 පිටුව 418 හිදී
මෙම කියමන විවේචනාත්මකව විග්‍රහ කරන්න.
ඔබගේ පිළිතුර විනිශ්චිත නඩුතීරණ මගින් තහවුරු කරන්න.

- හිමිකම් ඇවිරිණි. -